පොදු චක්‍රලේඛ ලිපි අංක: 02-74/2022

මගේ අංක: TCS/C/07/2021
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය", 385,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10
2022/09/ 21

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලංකා ජාතික රෝහල/ජාතික රෝහල, මහනුවර),
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
ශික්ෂණ රෝහල් / පළාත් මහ රෝහල් / දිස්ත්‍රික් මහ රෝහල් අධ්‍යක්ෂවරුන්,
විමධ්‍යගත ඒකක හා විශේෂිත ව්‍යාපාර ප්‍රධානීන්,
මූලික රෝහල් වල වෛද්‍ය අධිකාරීවරුන්,
නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන්.

**<u>ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන්ගේ තනතුරු පුරප්පාඩු පිරවීම - 2022</u>**

2014.10.11 දිනැති අංක 1883/17 දරණ ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය ව්‍යවස්ථා සංග්‍රහයේ 11:1:2:2 වගන්තිය අනුව අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති එනම් විද්‍යාපති / වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන / ප්‍රජා වෛද්‍ය / ප්‍රජා දන්ත වෛද්‍ය) සුදුසුකම් සපුරා ඇති නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ නිලධරයන්ගෙන් ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය ව්‍යවස්ථා සංග්‍රහයේ IV වන පරිශිෂ්ඨයෙහි ඇති තනතුරු අතුරින් 2022/09/21 දිනට පුරප්පාඩු වී ඇති තනතුරු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. නිලධාරියා විසින් තම කැමැත්ත පරිදි ප්‍රමාණවත් තනතුරු සංඛ්‍යාවක් කුසලතා ලේඛනයේ හිමි ස්ථානයට මනාප අනුපිළිවෙලින් පත්කරනු ලැබීම සඳහා සඳහන් කර නොමැති විට, ප්‍රමාණවත් මනාප සංඛ්‍යාවක් සලකුණු කල සුදුසුකම්ලත් නිලධාරීන් සියල්ල අනුයුක්ත කිරීමෙන් පසු ඉතිරි පුරප්පාඩු තිබේ නම් ඒ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අභිමතය පරිදි පත්වීම් බලධාරියා විසින් තනතුරු ලබා දෙනු ඇත.

03. 2022/09/21 දිනට ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ පවත්නා පුරප්පාඩු ලේඛණය ඇමුණුම 01 හි දක්වා ඇත.

04. තම අයදුම්පත් ඉවත් කර ගැනීමට අපේක්ෂා කරන අයදුම්කරුවන්, අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනයේ සිට සති දෙකක් තුල එසේ කළ යුතුය.

**05. අධ්‍යාපන සුදුසුකම්**

05:1 අංක 1883/17 දරණ 2014.10.11 දිනැති ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ IV වන පරිශිෂ්ඨයේ සහ ඉන් අනතුරුව එයට සිදු කරන ලද සංශෝධනයන් පරිදි නිලධාරියා විසින් අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය වන විට අදාළ තනතුර සඳහා අදාල පශ්චාත් උපාධි සුදුසුකම් වන විද්‍යාපති / වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන / ප්‍රජා වෛද්‍ය / ප්‍රජා දන්ත වෛද්‍ය) සම්පූර්ණ කර තිබිය යුතුය.

## 06. මූලික සුදුසුකම්

06:1 ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය සඳහා මූලික සුදුසුකම ලෙස සලකනු ලබන්නේ නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියයි.

06:2 නිලධාරියා නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ වසර 3 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

06:3 රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

06:4 අදාල නිලධරයන් දැනටමත් රාජ්‍ය සේවයේ සිටින බැවින් උපරිම වයස් සීමාව අදාල නොවේ.

## 07. සේවා නියමයන් සහ කොන්දේසි:

07:1 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගත් අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති VIII පරිච්ඡේදයේ 97 වන රීතිය අනුව වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ලැබේ. තෝරාගත් නිලධාරියා වැඩ බැලීමේ කාලය තුල හෝ එය අවසානයේ හෝ කුමන හෝ අවස්ථාවකදී කවර හෝ හේතුවක් මත එම තනතුර දැරීමට නුසුදුසු බවට ඔප්පු වුවහොත් ඔහු හෝ ඇය කලින් දරණ ලද තනතුරට පෙරලා යවනු ලැබේ.

07:2 මෙම ශ්‍රේණියේ තනතුරුවලට පත් කරන ලද වෛද්‍ය නිලධරයන්ට / දන්ත ශල්‍ය වෛද්‍ය නිලධරයන්ට පෞද්ගලික වෛද්‍ය වෘත්තියේ යෙදීමට අවසර නොලැබෙනු ඇත.

07:3 අයදුම්කරුවන් විසින් මෙම නිවේදනයේ සඳහන් සියළුම සුදුසුකම්, අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

07:4 මෙම ශ්‍රේණියට පත්කරනු ලබන නිලධාරීන් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/06-04/02/2016 හා 2017.06.01 දිනැතිව අනුමත කරන ලද හා 2019.12.14 දිනැතිව සංශෝධනය කරන ලද, වෛද්‍ය පරිපාලන ශ්‍රේණයේ නිලධරයන්ගේ ස්ථාන මාරු පරිපාටියට යටත් වේ.

07:5 ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ තනතුරක දැනට වැඩ බලන / රාජකාරී ඉටු කරන / රාජකාරී ආවරණය කරන නිලධාරීන් එකී තනතුරට තෝරා පත් වුවහොත් අදාල පත්වීම් දිනය පෙරදාතම කරන ලෙසට කිසිදු ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට නිලධරයාට කිසිඳු හිමිකමක් නැත.

## 08. වැටුප් පරිමාණය

08:1 මසකට රු.76,175X2170=110,895/= ක වැටුප (SL-01/2016 පියවර 20) මෙම ශ්‍රේණියට අදාල වේ.

08:2 පශ්චාත් උපාධි සුදුසුකම් සහිත වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ නිලධාරීන්ට අනෙකුත් දීමනා වලට අමතරව මසකට රු 6,000/- ක විශ්‍රාම වැටුප් සහිත පෞද්ගලික වෛද්‍ය වෘත්තියේ නොයෙදීම වෙනුවෙන් දීමනාවක් ගෙවනු ලැබේ.

08:3 විශේෂඥ වෛද්‍ය නිලධරයෙකු මෙම ශ්‍රේණියේ තනතුරක් සඳහා තෝරාගනු ලැබුව හොත් විශේෂඥ වෛද්‍ය නිලධරයෙකුට හිමි වැටුප් හා දීමනා ගෙවනු ලැබේ.

## 09. සම්මුඛ පරීක්ෂණය

09:1 සේවා කාලය (ලකුණු 55)

09:1:1 ප්‍රාථමික ශ්‍රේණිය - වසරකට ලකුණු එක බැගින්
09:1:2 II ශ්‍රේණිය - වසරකට ලකුණු එක බැගින්
09:1:3 I ශ්‍රේණිය - වසරකට ලකුණු එක බැගින්
09:1:4 විශේෂඥ ශ්‍රේණිය - වසරකට ලකුණු එක බැගින්
09:1:5 නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණිය
- වසරකට ලකුණු 05 බැගින්

සටහන:

I. සේවා කාලයන් සඳහා ලකුණු ලබා ගත හැක්කේ එක් නිශ්චිත කාලසීමාවක් සඳහා එක් ශීර්ෂයක් යටතේ පමණි. වෙනත් ශීර්ෂයක් යටතේ එම කාලසීමාව සඳහා ලකුණු ලබාගත නොහැකිය.

II. සක්‍රිය සේවා කාලයන් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. වසරකට අඩු කාලයක් සඳහා කාර්තු මට්ටමින් සමානුපාතිකව ලකුණු ලබා දෙනු ලැබේ.

09:2 අධ්‍යාපන සුදුසුකම් (ලකුණු 25)

09:2:1 වෛද්‍ය විශාරද උපාධිය සමඟ මාණ්ඩලික සහතිකය ලබා ඇති - ලකුණු 25
(වෛද්‍ය පරිපාලන / ප්‍රජා වෛද්‍ය / ප්‍රජා දන්ත වෛද්‍ය)
09:2:2 වෛද්‍ය විශාරද උපාධිය සමඟ මාණ්ඩලික සහතිකය ලබා නැති - ලකුණු 20
(වෛද්‍ය පරිපාලන / ප්‍රජා වෛද්‍ය / ප්‍රජා දන්ත වෛද්‍ය)
09:2:3 විද්‍යාපති උපාධිය (වෛද්‍ය පරිපාලන / ප්‍රජා වෛද්‍ය / ප්‍රජා දන්ත වෛද්‍ය) - ලකුණු 15

සටහන:
ඉහත සුදුසුකම් අතුරින් නිලධාරියා ලබා ගත් ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

09:3 පර්යේෂණ/ප්‍රකාශන (ලකුණු 10)

ප්‍රකාශිත පර්යේෂණයකට / ප්‍රකාශනයකට ලකුණු 02 බැගින් (ප්‍රකාශිත පර්යේෂණයකට / ප්‍රකාශන ඇගයීමේ දී ඇමුණුමෙහි සඳහන් නිර්ණායක පදනම් කරගනු ලැබේ)

සටහන:
පශ්චාත් උපාධි සඳහා ඉදිරිපත් කළ පර්යේෂණ/ප්‍රකාශන මේ යටතේ සලකා බලනු නොලැබේ.

09:4 සම්මුඛ පරීක්ෂණය (ලකුණු 10)
(කුසලතාවය / නායකත්වය / ආකල්ප / පෞර්ෂත්වය හා සන්නිවේදන කුසලතා සඳහා)

10. සුදුසුකම් ඇති සියලු නිලධාරීන් ඔවුන්ගේ අයදුම්පත් මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කළ යුතුය. මාර්ගගත අයදුම්පත **medserv.health.gov.lk** හි ඇත. මාර්ගගත පද්ධතිය 2022/09/21 සිට 2022/09/30 දක්වා අයදුම් කිරීම සඳහා සූදානම් කර ඇත.

මාර්ගගත අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසුව අදාල ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද එහි මුද්‍රිත පිටපත 2022/10/14 දිනට පෙර ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.


**ලේකම්,**
**සෞඛ්‍ය අමාත්‍යාංශය,**
**"සුවසිරිපාය",**
**385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,**
**කොළඹ 10.**

දුරකතන අංක; 011-2699145 ෆැක්ස් අංක; 011-2692913


රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි,


එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත,
ලේකම්

එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.